අධ්‍යාපන හා පර්යේෂණ පුවත්

# සම්ප්‍රේෂණ NEWSLETTER

පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

2019 ජූලි - දෙසැම්බර්
දෙවැනි වෙළුම දෙවැනි කලාපය

**ඵලදායි සංවාදයක් වෙනුවෙන් ආරාධනා**

## ජාතික අධ්‍යාපන ආයතනයෙන් Channel NIE නමින් අන්තර්ජාල නාලිකාවක්




ජාතික අධ්‍යාපන ආයතනයේ විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව අනෙකුත් දෙපාර්තමේන්තු සමග ඒකාබද්ධ ව, විෂය මාලාවට අනුකූල වූ ප්‍රවිශේෂ තේමා යටතේ, ඩිජිටල් තාක්ෂණය භාවිත කරමින්, අධ්‍යාපනික වීඩියෝ වැඩසටහන් (Educational Videos) නිෂ්පාදනය කිරීමේ ක්‍රියාදාමයක නිරත ව සිටියි.

දෙවැනි පිටුවට...

### ඇතුළත පිටු අතර

03 ගණිත සාධනය ඉහළ මට්ටමකට රැගෙන යෑමට අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප - අ.පො.ස. (සා. පෙ.) විභාගයේ ගණිත ප්‍රශ්න පත්‍රයට නව ප්‍රවේශයක්

04 වර්ෂ 2020 න් ඔබ්බට පාසල් විෂයමාලාව තුළ බුද්ධ ධර්මය විෂයය සකස් විය යුතු ආකාරය

05 උපාධිධාරී නොවන පුහුණු ගුරුවරුන් සඳහා වූ ගුරු පුහුණු පාඨමාලාව

07 කාර්යසිද්ධි කළමනාකරණය

09 පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව

11 ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අනුස්මරණ දේශනමාලාවේ 30 වන දේශනය

12 නවතම පුවත්

## විද්‍යා අධ්‍යාපනය පිළිබඳ සම්මන්ත්‍රණයේ පර්යේෂණ අනාවරණ



අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා ශාඛාව සහ ජාතික අධ්‍යාපන ආයතනයේ විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සමග එක් ව වර්ෂ 2019 අගෝස්තු 01 වන දින, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එම්. එන්. රණසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, "ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය තුළ විද්‍යා අධ්‍යාපනයේ ඉදිරි ගමන කෙසේ විය යුතු ද?" යන තේමාව යටතේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය, විශ්වවිද්‍යාල, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ කලාප අධ්‍යාපන කාර්යාල නියෝජනය කරන, විද්‍යා අධ්‍යාපනයට සම්බන්ධ නිලධාරී පිරිසක් සහභාගි වූහ.

සම්මන්ත්‍රණය ආරම්භයේ දී ආරාධිත දේශකයන් විසින් විද්‍යා අධ්‍යාපනය හා සබැඳි කාලීන වශයෙන් වැදගත් දේශන පවත්වන ලද අතර, එම දේශන අවසානයේ දී, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සහ විශ්වවිද්‍යාල පද්ධතිය නියෝජනය කරන, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට සම්බන්ධ විද්වතුන් විසින් විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විමර්ශනාත්මක ප්‍රත්‍යවේක්ෂණයක් (A Critical Reflection on Science Education) යන මැයෙන් සාකච්ඡා මණ්ඩපයක් (Panel Discussion) පවත්වන ලදී.

සම්මන්ත්‍රණයේ තවත් වැදගත් අංගයක් වූයේ සම්මන්ත්‍රණයට සහභාගි වූ විද්වත් මණ්ඩලයෙන්, ශ්‍රී ලංකාවේ විද්‍යා අධ්‍යාපනයට සම්බන්ධ ඉදිරි ප්‍රතිසංස්කරණවල දී සලකා බැලිය යුතු කරුණු පිළිබඳ ව ප්‍රශ්නාවලියකින් අදහස් ලබා ගැනීම යි. අධ්‍යාපන අමාත්‍යාංශයේ, ජාතික අධ්‍යාපන ආයතනයේ සහ විද්‍යාභිවර්ධන සංගමයේ නිලධාරීන් එක්ව සකස් කරන ලද ප්‍රශ්නාවලියෙහි තේමා හතක් ඔස්සේ ප්‍රශ්න ඉදිරිපත් කෙරිණි. එම තේමා යටතේ ප්‍රකාශිත අදහස්වල සාරාංශය මතු සඳහන් පරිදි වේ.

## විද්‍යා විෂයෙන් ළඟා කර ගත යුතු ඉගෙනුම් ඵල

ඉදිරි අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල දී මූලික ව ම විද්‍යා විෂයය සම්බන්ධයෙන් ඉගෙනුම් ඵල සමුදායක් හඳුනා ගත යුතු වේ. එම ඉගෙනුම් ඵල සමුදාය,



- අත්‍යවශ්‍ය සහ අභිමත ඉගෙනුම් ඵල ලෙස වෙන් වෙන් වශයෙන් හඳුනා ගත යුතු ය
- එක් එක් ප්‍රධාන අවධිය සඳහා (උදා: 1-5 ශ්‍රේණි, 6-9 ශ්‍රේණි, 10-11 ශ්‍රේණි ලෙස) වෙන් වෙන් වශයෙන් හඳුනා ගත යුතු ය
- ජාතික පොදු අරමුණු ළඟා කර ගැනීමටත් රටේ ආර්ථික සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමටත් හැකි වන සේ සකස් විය යුතු ය
- තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලනු පිණිස මෙන් ම 21 වන සියවසට අදාළ කුසලතා එමඟින් සාධනය විය යුතු ය

### විද්‍යා විෂයය අන්තර්ගතය

විද්‍යා විෂයය අන්තර්ගතය තෝරාගත යුත්තේ හඳුනාගත් ඉගෙනුම් ඵල සමුදාය සාක්ෂාත් කර ගැනීම පහසු වන පරිදි ය

එම අන්තර්ගතය සකස් විය යුත්තේ අනෙකුත් විෂය සමඟ තිරස් හා සිරස් සමෝධානය ඇති වන පරිදි ය

වෙනත් රටවල ක්‍රියාත්මක පාසල් විද්‍යා විෂයමාලාවලට සමගාමී වන පරිදි ය

ප්‍රාදේශීය වශයෙන් පවත්නා විෂමතාවන්ට අනුකූල වන පරිදි විෂය අන්තර්ගතයෙහි සුළු සංශෝධන සිදු කිරීමට පළාත්, කලාප සහ පාසල් බලධාරීන්ට අවකාශ ලැබෙන පරිදි ය

විද්‍යාවේ නව විෂය ක්ෂේත්‍ර පිළිබඳ ශිෂ්‍යයා යාවත්කාලීන වන පරිදි ය

එසේ ම විද්‍යාත්මක සංකල්ප සංවර්ධනය වන පරිදි ප්‍රාථමික විෂයමාලාව නවීකරණය විය යුතු ය.

### ශික්ෂණවේදය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, විද්‍යාවේ ක්‍රියාවලි කුසලතා (Science process skills) සංවර්ධනය වන පරිදි සැලසුම් කිරීමේ වැදගත්කමත්, ගණිතය, තාක්ෂණවේදය වැනි විෂයන්ගෙන් ලැබෙන දැනුම හා කුසලතා සමෝධානය කර ගනිමින් විද්‍යා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතු ය. එලෙස ම විද්‍යාව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙන් සිසුන්ට මෘදු කුසලතා සංවර්ධනයට පෞරුෂ සංවර්ධනයට හා ආදිය සඳහා ඉඩ ප්‍රස්ථා තිබිය යුතු ය.

### විෂයමාලා ද්‍රව්‍ය

විෂය නිර්දේශයට අමතර ව සවිස්තරාත්මක ගුරු මාර්ගෝපදේශයක් ගුරුවරුන් අතට පත් කළ යුතු බවත් විද්‍යා විෂයය සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් පොතක් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයට අමතර ව ලබා දීමේ වැදගත්කමත් අවධාරණය විය.

### සිසු තක්සේරුකරණය සහ ඇගයීම

විද්‍යාව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පාසල් පාදක තක්සේරුකරණය සඳහා වැඩි ප්‍රමුඛතාවක් ලබා දීමේ වැදගත්කම සහ ජාතික මට්ටමේ ඇගයීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණ යොදා ගැනීමේ වැදගත්කම ද අවධාරණය විය.

### යටිතල පහසුකම්

උසස් විද්‍යාගාර පහසුකම් සහිත පාසල් හිඟවීම ප්‍රධාන ගැටලුවක් බැවින් විද්‍යාගාර යාවත්කාලීන කළ යුතු ය. තොරතුරු තාක්ෂණය හා විද්‍යා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සමෝධානය සඳහා ප්‍රමාණවත් පහසුකම් පාසල්වලට සැපයිය යුතු වේ.

### ගුරු අධ්‍යාපනය හා සංවර්ධනය

වර්තමානයේ දී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලින් 21 වන සියවසට උචිත කුසලතා සපිරි විද්‍යා ගුරුවරුන් බිහි කිරීමට ප්‍රමාණවත් දායකත්වයක් නොලැබේ. විද්‍යාව විෂයය ඉගැන්වීම සඳහා විශේෂ පුහුණුලාභී ගුරුවරුන් ප්‍රමාණවත් පරිදි දැනට සේවයේ යොදවා නොමැත. ගුරු සංවර්ධනය සඳහා ප්‍රමාණවත් අවස්ථා දැනට සපයා නොමැත. එමෙන් ම විද්‍යාපීඨවල විද්‍යා ගුරුවරුන් පුහුණු කරන පාඨමාලා ද නවීකරණය විය යුතු ය.

### අධ්‍යාපන ප්‍රතිපත්ති හා නියාමනය

විද්‍යා විෂයමාලාව වඩාත් ප්‍රායෝගික මුහුණුවරකින් ක්‍රියාවට නැංවීම සඳහා පවත්නා අධ්‍යාපන ප්‍රතිපත්ති යාවත්කාලීන කළ යුතු ය. පාසල් පාදක ව සිදු කෙරෙන අඛණ්ඩ තක්සේරුකරණය බල ගැන්වෙන පරිදි ප්‍රතිපත්ති සංශෝධනය විය යුතු ය. විද්‍යා විෂයය වඩාත් ප්‍රායෝගික මුහුණුවරකින් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ පාසල් මට්ටමින් මිළ දී ගැනීම පහසු වන පරිදි අදාළ චක්‍රලේඛ සංශෝධනය විය යුතු ය. පාසල්වල විද්‍යා ගුරුවරුන්ගේ වෘත්තීයේ විෂමතා අවම කිරීම සහතික කෙරෙන ප්‍රතිපත්තිමය තීරණවලට කඩිනමින් එළැඹිය යුතු ය. ප්‍රතිඵල ඉහළ නැංවීම ප්‍රමුඛ කර ගත් නියාමනය වෙනුවට සිසු නිපුණතා සාධනය ඉහළ නැංවීම අරමුණු කර ගත් නියාමනයක් සිදු කිරීමේ වැදගත්කම ද අවධාරණය විය.

මෙම සම්මන්ත්‍රණයෙන් විද්‍යා අධ්‍යාපනයේ ඉදිරි ගමන් මග හෙළි පෙහෙළි කර ගැනීම සඳහා අවශ්‍ය පර්යේෂණ පදනම සකස් කර ගැනීම සඳහා ඉමහත් පිටිවහලක් ලැබුණි.

# ගණිත සාධනය ඉහළ මට්ටමකට රැගෙන යෑමට අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප අ. පො. ස. [සා. පෙ.] විභාගයේ ගණිත ප්‍රශ්න පත්‍රයට නව ප්‍රවේශයක්




ගණිතය සර්ව ව්‍යාප්ත මාධ්‍යයකි. එය අප සියලු දෙනාගේ ජීවිතවල කොටසකි. එමෙන් ම එය අනුක්‍රමාධිපත්‍යයක් ඇති, නිර්මාණශීලී බව පෙරටු කොට ගත් තර්කානුකූල චින්තනයට ඉවහල් වන මනෝ රටා වර්ධනය මත රඳා පවතින ඉහළ මානසික හැකියා වර්ධනයට රුකුලක් වන විෂයයකි. එදිනෙදා කටයුතුවල දී අපි දැනුම්වත් ව හෝ නොදැනුම්වත් ව නිරන්තරයෙන් ගණිතය භාවිත කරන්නෙමු.

විභාගයේ දී පමණක් නොව දෛනික ජීවිතය තුළ සාර්ථකත්වය ලඟා කර ගැනීමට ද ගණිතය අත්‍යවශ්‍ය වේයි. ගණිතයෙන් හැකිමි දැනීම් ප්‍රකාශ කළ නොහැකි ය. එහෙත් ගණිතය අදහස් පළ කළ හැකි භාෂාවකි. ගණිතයෙහි ඇති ප්‍රබලතම ගුණාංගය එහි ඇති වියුක්ත බව යි.

ගණිතය ඉගැන්වීමේ දී ගුරුභවතුන් ගණිතයේ මෙම ස්වභාවය ගැන ගැඹුරු අවබෝධයක් ලබා තිබිය යුතු අතර, ඊට ගැළපෙන ලෙස ඉගැන්වීම් ක්‍රමවේද යොදා ගත යුතු ය. එම ඉගෙනුම් ක්‍රමවේද සිසුන්ගේ පරිණතිය හා සාධන මට්ටම්වලට අනුව, වියුක්ත සංකල්ප, සංයුක්ත සංකල්ප බවට පරිවර්තනය කරමින් ශිෂ්‍යයින් තුළ ප්‍රබල මනෝ රටා ගොඩ නැංවීමට සමත් විය යුතු ය.

අ. පො. ස. (සා. පෙ.) මට්ටමේ දී ශිෂ්‍යයන් හැදෑරිය යුතු හර විෂය අතර ගණිතය විෂයයට හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. එබැවින් සාමාන්‍ය පෙළ විභාගයේ ගණිතය ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින දරුවන් මුහුණ දෙන ගැටලු හඳුනා ගනිමින්, සිසුන්ගේ ගණිත කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා, ගණිතය විෂය අන්තර්ගතය සංවර්ධනය විය යුත්තේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට 2014 වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශේෂ උපදේශක කමිටුවක් පත් කරන ලදී. සියලු ශිෂ්‍යයන්ට ගැළපෙන පරිදි හඳුනා ගත් අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප ඇසුරින් ශිෂ්‍යයින්ගේ ගණිත සාධනය ඉහළ නැංවීම කෙරෙහි එම වාර්තාවේ (අ. පො. ස. සා.පෙ. ශිෂ්‍යයින්ගේ ගණිත කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වූ විශේෂ උපදේශක කමිටුව විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව) විශේෂ අවධානයක් යොමු කර තිබුණි. උපදේශක කමිටුව විසින් ගණිත කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා ඉදිරිපත් කරන ලද වැදගත් නිර්දේශ හතරකි.



01-ද්විතීයික අධ්‍යාපනය සඳහා ඉදිරිපත් කරනු ලබන ගණිතය විෂය අන්තර්ගතය;

ශාස්ත්‍රීය හෝ පර්යේෂණාත්මක ගණිතයට සමාන නොවිය යුතු ය

දැනුම්වත් පුරවැසියන් ලෙස දිවි ගෙවීමට අවශ්‍ය ජීවන කුසලතා සංවර්ධනය පිණිස උපකාර කරන්නක් වීම

අනෙකුත් විෂය ඉගෙනීමට උපකාරී වන විෂයයක් වීම

වඩාත් ඵලදායී ඉගෙනුමකට හේතු වන පරිදි, ප්‍රමුඛතා අනු පිළිවෙළකට අනුගත ව ගණිත සංකල්ප හඳුන්වා දීම

02- ගණිත සාක්ෂරතාවෙන් යුත් පුරවැසියෙකු ලෙස සැලකීමට හා සෑම දෙනා විසින් ම එක ම ගණිතයක් ඉගෙන ගැනීමට සිදු ව තිබීමේ තත්ත්වයට සුදුසු ප්‍රතිකාර්ය විසඳුමක් ලෙස, ගණිත විෂයයට අදාළ ව 10 සහ 11 ශ්‍රේණිවල ශිෂ්‍යයන් ඉගෙන ගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප (Essential learning concepts) හඳුනා ගැනීම. එය ඔවුන්ට ගණිතයේ සමාජීය උපයෝගිතාව විචාරාත්මක ව තක්සේරු කිරීමට ද රුකුලක් වනු ඇත.




03- අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්පවලට අයත් ගැටලු විසඳීමේ ක්‍රමික හා සංකල්පීය දැනුම ආදර්ශනය කිරීමට හැකි වන පරිදි සිසුන් සාධනය කර ගත යුතු අවම සාධන මට්ටම (Basic Achievement Level - BAL) පිළිබඳ එකඟතාවයකට එළඹිය යුතු ය. මෙහි දී අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප මත විෂය අන්තර්ගතය තීරණය කළ යුතු අතර, අවම සාධන මට්ටමක් ඔස්සේ දරුවන් ඇගැයීමට ලක් කළ යුතු ය.

04- උක්ත නිර්දේශවලට අනුගත ව අ.පො.ස. (සා. පෙ.) විභාගයේ ගණිතය ප්‍රශ්න පත්‍රයේ සංයුතිය ප්‍රතිව්‍යුහගත කළ යුතු ය. එහි දී

- ගණිතය ප්‍රශ්න පත්‍රය I කොටස පැය දෙකක කාල සීමාවකට යටත් වන පරිදි, අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප මැනෙන ලෙස කෙටි පිළිතුරු සහිත ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයක් ලෙස සංවර්ධනය විය යුතු ය. එය අවසාන ප්‍රතිඵලයෙන් 50%කට දායකත්වයක් දැක්විය යුතු ය.

- ඉහළ සාමර්ථ්‍යයක් අපේක්ෂිත සහ උසස් අධ්‍යාපනයට යොමුවක් සහිත වඩා ශාස්ත්‍රීය හැකියාවෙන් යුතු ශිෂ්‍යයන් ඉලක්ක කර II ප්‍රශ්න පත්‍රය සංවර්ධනය කළ යුතු ය. පැය තුනක කාල සීමාවකට යටත් ව, ව්‍යුහගත රචනාමය ප්‍රශ්නවලින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය ද අවසාන ප්‍රතිඵලයෙන් 50%කට දායකත්වයක් දැක්විය යුතු ය.

අනෙකුත් පිටුවට...

# වර්ෂ 2020 න් ඔබ්බට පාසල් විෂයමාලාව තුළ බුද්ධ ධර්මය විෂයය සකස් විය යුතු ආකාරය

ශිෂ්ට සම්පන්න සමාජයක් ගොඩ නැංවීම සමාජ වගකීමකි. පාසල් විෂයමාලාව තුළ ඒ වෙනුවෙන් ලබාගත හැකි ඉඩකඩ සුළුපටු නොවේ. ආගම විෂයයක් ලෙස එක් කිරීම පමණක් ඒ සඳහා ප්‍රමාණවත් නොවේ. විෂයයක් වශයෙන් ආගම ඉගැන්වීම වෙනුවට වඩාත් ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙමින්, ජීවිතය පිළිබඳ අවබෝධය පුළුල් කරන, අත්හොහළ යුතු අංගයක් ලෙස ආගම දරුවන් වෙත ළඟා කරවිය යුතු ව ඇත. මේ සඳහා දැනට ආගම විෂයය පාසල් විෂයමාලාවේ ක්‍රියාවට නැංවෙන ආකාරය, එහි සාධනීය තත්ත්ව සහ සංශෝධනය විය යුතු තත්ත්ව කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

වර්ෂ 2020න් ඔබ්බට අලුතින් සකස් වන පාසල් විෂයමාලාවේ ආගම හා සාරධර්ම අධ්‍යාපනය යටතේ වන විෂයයක් වශයෙන් 6-11 ශ්‍රේණිවල බුද්ධ ධර්මය විෂයය ඉගැන්වීමට සුදුසු ආකාරය, විෂයය අන්තර්ගතය සකස් විය යුතු ආකාරය, සහ ඊට අදාළ ව ඉදිරිපත් කළ හැකි යෝජනා හඳුනා ගැනීම අරමුණු කර ගනිමින් පර්යේෂණයක් කරන ලදී. ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ පළාත් නවයට අයත් අධ්‍යාපන කලාප 42ක 6-11 ශ්‍රේණි සිසුන් 470ක්, ගුරු භවතුන් 250ක් සහ දෙමාපියන් 300ක් සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක කර තිබේ. එහි දී බුද්ධ ධර්ම විෂයයේ විෂය අරමුණු හා නිපුණතා මට්ටම්වලට ළඟා වීමට දැනට සතියකට වෙන් කර ඇති කාලච්ඡේද දෙක ප්‍රමාණවත් නොවන බවත් එම කාලච්ඡේද සංඛ්‍යාව පහක් දක්වා වැඩි කළ යුතු බවත් යෝජනා වී ඇත. මෙම කරුණ "ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා-2016" කෘතියේ අන්තර්ගත ප්‍රකාශ ඇසුරින් තවදුරටත් පැහැදිලි වේ. එහි සඳහන් කරන පරිදි, ශ්‍රී ලංකාවේ සංස්කෘතිය සහ ආචාර ධර්ම, එවායේ ඵලදායී භාවිතය සිසුන්ට හඳුන්වා දීම ප්‍රාථමික අවධියේ ආරම්භයත් සමග පාසලේ දී සිදු කළ යුතු ය. මෙය ප්‍රධාන වශයෙන් ආගම් විෂයයෙන් සිදු කළ යුතු බව ද ආගම විෂයය අන්තර්ගතය ප්‍රායෝගික ව ලබා දෙන විෂයයක් කළ යුතු බවට ද එහි යෝජනා කර ඇත. සංස්කෘතිය හා ආචාරධර්ම ඵලදායී ලෙස හඳුනා ගනිමින් ප්‍රායෝගික ව යොදා ගත හැකි විෂයයක් ලෙස බුද්ධ ධර්මය විෂයයට ලබා දී ඇති කාලච්ඡේද සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින්, එම විෂයය මගින් සාරධර්ම ප්‍රවර්ධනය සඳහා වැඩි කාලච්ඡේද සංඛ්‍යාවක් වෙන් කිරීම සුදුසු බව ද එහි අවධාරණය කරයි. එමෙන් ම ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබූ "අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා සබැඳි මත විමසුම-2018" පර්යේෂණ වාර්තාවේ පෙන්වා දෙන ආකාරයට ද ආගම හර විෂයයක් ලෙසත්, සතියකට කාලච්ඡේද පහකින් සමන්විත වීම යෝග්‍ය බවටත් අදහස් ඉදිරිපත් කර ඇත. එමෙන් ම අනාගතයේ දී ආගම් විෂයයට අදාළ ව පාසල් විෂයමාලාව සකස් කිරීමේ දී මතු සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු යයි ද යෝජනා වී තිබේ.



- ආගම හා සාරධර්ම විෂයය ප්‍රායෝගික ව ක්‍රියාත්මක කළ හැකි ආකාරයට සංවර්ධනය කළ යුතු ය
- ආගම හා සාරධර්ම විෂයය අන්තර්ගතයට වෙනත් ආගම් හා සංස්කෘති පිළිබඳ විෂය කරුණු ඇතුළත් කළ යුතු ය
- ආගම හා සාරධර්ම විෂයයට වැඩි කාලච්ඡේද සංඛ්‍යාවක් වෙන් කිරීම සතුටුදායක වුවත් එසේ වැඩි වන කාලච්ඡේද සංඛ්‍යාව පුරණය කිරීම සඳහා වෙනත් විෂයවල කාලච්ඡේද අඩු නො කළ යුතු ය
- ඉරු දින දහම් පාසල් ක්‍රමය අනිවාර්යය කළ යුතු ය



එමෙන් ම තවදුරටත් ආගම් හා සාරධර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද පර්යේෂණයේ අනාවරණ අනුව, 6-11 ශ්‍රේණි ගුරු මාර්ගෝපදේශ ඉහළ ප්‍රමිතියකින් ලියා තිබීම හා පෙළපොත්වල නිමාව හොඳ තත්ත්වයේ තිබීම මෙන් ම ගුරු මාර්ගෝපදේශයේ ඉගෙනුම් පල පැහැදිලි ව ලියා තිබීම කෙරෙහි පර්යේෂිත කණ්ඩායමෙන් 88%ක් ප්‍රසාදය පළ කර ඇත. විෂයය අන්තර්ගතයෙහි ඇති බුද්ධ චරිතය, ශාසන ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතිය යන ක්ෂේත්‍රවලට අදාළ පාඩම්වලට සිසුන්ගෙන් 94%ක් ඉහළ රුචිකත්වයක් පළ කර ඇත. එහෙත් ඇතැම් ශ්‍රේණිවල ඇතැම් පාඩම්වලට පවත්නා විෂය අන්තර්ගතය පමණ ඉක්මවා ඇති බව 91%ක් ප්‍රකාශ කර ඇත. බුද්ධ ධර්මය විෂයය සම්බන්ධයෙන් ඉගැන්වීම් කරන ගුරුවරුන්ට ද ධනාත්මක ආකල්ප නොමැති බවත් ඉගැන්වීම්



# උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන් සඳහා වූ ගුරු පුහුණු පාඨමාලාව

කටයුතුවල දී බොහෝ ගුරුවරුන් විෂය දැනුම පමණක් ගුරුකොට ගන්නා බවත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිලිමත් නොවන බවත්, සිසුන්ගේ අදහස විය. මීට ප්‍රධාන හේතුව වශයෙන් හෙළි වී ඇත්තේ බුද්ධ ධර්ම විෂයය ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් දැනුමක් ඇති පුහුණු ගුරුවරුන් නොමැති වීම සහ බොහෝ පාසල්වල බුද්ධ ධර්ම විෂයයට යොදවා ඇති ගුරුවරුන් අදාළ විෂයය ඉගැන්වීමට ප්‍රවීණත්වය දක්වන ගුරුවරුන් නොවීම බවයි.



සිසුන්ගේ සාරධර්ම සංවර්ධනය වන, සහජීවන සංකල්පය තහවුරු කරන, ආචාර ධර්ම ඉස්මතු වන ආකාරයට විෂය අන්තර්ගතය වෙනස් විය යුතු වන අතර, ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා වැඩි ඉඩක් ලබා දිය යුතු බවත්, දෛනික ජීවිතයට ගැළපෙන ලෙස විෂය බාහිර හා විෂය සමගාමී ක්‍රියා සැක් විය යුතු බවත් මේ අනුව තහවුරු වේ. පෙළපොත්වල විෂය කරුණු පුනර්ස්ථාපනය නොවිය යුතු අතර 10-11 ශ්‍රේණි සඳහා ව්‍යාපෘති පාදක ඉගෙනුම් ක්‍රමය ඇතුළත් කළ යුතු ව ඇත. විෂය සන්ධාරය කාලච්ඡේද ප්‍රමාණයට ගැළපෙන පරිදි සංශෝධනය විය යුතු අතර, පෙළ පොත්වල ඇතැම් පාඩම් ලිවීමේ දී (බුදු දහමේ මූලික ඉගැන්වීම්) සරල බස් වහරක් භාවිත කළ යුතු ය. පාඩම් අවසානයේ සෑම දුරවබෝධ වචනයක ම අර්ථය සරල බසින් සටහන් කරන්නේ නම් සිසුන්ට එය ස්වයං අධ්‍යයනයට ද පිටුබලයක් වනු ඇත.

බුද්ධ ධර්මය විෂයය සම්බන්ධ ව පෙළ පොත් ලිවීමේ දී විෂය අන්තර්ගතයට අන්‍ය ආගම්වල මූලික හැඳින්වීම් සමග ආගමික උත්සව ආදිය ද ඇතුළත් කිරීමෙන් සමාජ සංහිඳියාව ගොඩ නැංවීමටත් විවිධත්වය කෙරෙහි ගරු කරන, අන් මත ඉවසන සමාජ සංවේදී සංකල්ප දරුවන් තුළ ඇති කිරීමටත් හැකි වනු ඇත. බුද්ධ ධර්මය විෂයයෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ බහුවිධ බුද්ධි න්‍යාය හා නිර්මාණ චින්තනය ද අන්තර්ගත වන අයුරින් ඉගැන්වීම් කටයුතු කිරීමට ගුරුභවතුන් පුහුණු කළ යුතු ය. බහුවිධ බුද්ධි න්‍යාය හා නිර්මාණ චින්තනය ඉස්මතු වන අයුරින් ගුරු මාර්ගෝපදේශ හා පෙළ පොත් සම්පාදනය කිරීමෙන් විෂය සාධනය මෙන් ම දරුවන් තුළ ජීවන යහපුරුදු සංවර්ධනයට ද අවස්ථාව සැලසේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යභාරය පැවරී ඇත්තේ ගුරුවරයා වෙත ය. එය ගුරුවරයාගේ ප්‍රමුඛ කාර්යය වුව ද සමාජ සචලතාවක් ඇති කිරීමේ ගාමක බලවේගයක් වශයෙන් ගුරුවරයා යනු, සංකීර්ණ භූමිකා රාශියක සංකලනයකි. එබැවින් ගුරුවරයෙකුට තම වෘත්තීය කටයුතු ඵලදායී ව හා කාර්යක්ෂම ව පවත්වා ගෙන යාම සඳහා මනා වෘත්තීය පුහුණුවක් මෙන් ම මාර්ගෝපදේශකත්වයක් ද අවශ්‍ය වේ. එබැවින් දැනට ගුරු වෘත්තියේ නියැළී සිටින උපාධිධාරී නොවන නුපුහුණු ගුරු භවතුන් සඳහා පාඨමාලාවක් ජාතික අධ්‍යාපන ආයතනයේ, ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨයට අයත් ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යනු ලැබේ. මේ සඳහා මූල්‍ය අනුග්‍රහය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සපයා දෙනු ලැබ ඇති අතර, දැනට මෙම පාඨමාලාව දිවයිනේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන අටක දී ගුරුවරුන් 747 දෙනෙකු සඳහා පවත්වනු ලැබේ.

## පාඨමාලාව පැවැත්වෙන ප්‍රාදේශීය මධ්‍යස්ථාන

1. අනුරාධපුර - ගුරු මධ්‍යස්ථානය, අනුරාධපුරය
2. කුරුණෑගල - ගුරු මධ්‍යස්ථානය, කුරුණෑගල
3. මහරගම - ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මහරගම
4. මොණරාගල - ගුරු මධ්‍යස්ථානය, මොණරාගල
5. මහනුවර - මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, පොල්ගොල්ල
6. පේරාදෙණිය - පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, පැණිදෙණිය
7. බණ්ඩාරවෙල - ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, බිඳුනුවැව
8. රත්නපුර - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, පැලවත්ත



පාසල් පද්ධතියේ සේවය කරන, මූලික ගුරු පුහුණුව සම්පූර්ණ නොකළ ගුරු භවතුන්. ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 19.3 සඳහන් පරිදි ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාලීම, මෙම පාඨමාලාව මගින් සිදු කෙරෙයි. දැනට ක්‍රියාත්මක පාඨමාලා වර්ග හතරකි.

- ප්‍රාථමික අධ්‍යාපන පාඨමාලාව (සිංහල මාධ්‍ය)
- ප්‍රාථමික අධ්‍යාපන පාඨමාලාව (දෙමළ මාධ්‍ය)
- බටහිර සංගීතය පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍ය)
- ඉංග්‍රීසි පාඨමාලාව

මෙම පාඨමාලාව සම්මුඛ සැසි, දේශන, පැවරුම් සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් ද සහිත ව සති අන්ත දිනවල සහ පාසල් නිවාඩු කාලවල දී මතු සඳහන් විෂය ක්ෂේත්‍ර හතර යටතේ පවත්වනු ලැබේ.

1. වෘත්තීය විෂය ක්ෂේත්‍රය
2. විශේෂ විෂය ක්ෂේත්‍රය
3. සාමාන්‍ය විෂය ක්ෂේත්‍රය
4. අධ්‍යාපන ව්‍යවහාර (ප්‍රායෝගික ගුරු පුහුණුව)





වෘත්තීය, සාමාන්‍ය සහ අධ්‍යාපන ව්‍යවහාර යන විෂය ක්ෂේත්‍ර පාඨමාලාලාභීන් සියලු දෙනා ම හැදෑරිය යුතු අතර විශේෂ විෂය ක්ෂේත්‍රය තම පත්වීමට අදාළ විෂයය අනුව වෙනස් වේ.

- **වෘත්තීය විෂය ක්ෂේත්‍රය** යටතට අධ්‍යාපන මනෝවිද්‍යාව, අධ්‍යාපන මූලධර්ම සහ පාසල් කළමනාකරණය හා අධ්‍යාපන මිනුම් ඇගයුම් සහ තක්සේරුකරණය යන විෂය ඇතුළත් වේ.

- **විශේෂ විෂය ක්ෂේත්‍රය** යටතට ගුරුවරයාගේ පළමු විෂය සහ දෙවන විෂය ඇතුළත් ය.

- **සාමාන්‍ය විෂය ක්ෂේත්‍රයට** අයත් වන්නේ පළමු බස (සිංහල/දෙමළ), සෞඛ්‍යය සහ ශාරීරික අධ්‍යාපනය, සෞන්දර්ය (චිත්‍ර/නැටුම්/සංගීත/නාට්‍යකරණය), තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, ඉංග්‍රීසි භාෂාව සහ දෙවන ජාතික භාෂාව (සිංහල/දෙමළ) යන විෂය ය.

- **අධ්‍යාපන ව්‍යවහාර හෙවත් ප්‍රායෝගික ගුරු පුහුණුව** පළමු අදියර හා දෙවන අදියර වශයෙන් අධ්‍යයන වර්ෂ දෙකක දී ක්‍රියාත්මක කෙරේ.



පාඨමාලාවේ තක්සේරුකරණය හා ඇගයීම, අභ්‍යන්තර අඛණ්ඩ තක්සේරුකරණය සහ බාහිර අවසාන ඇගයීම වශයෙන් දෙ ආකාරයකින් සිදු කෙරේ. අභ්‍යන්තර ඇගයීම ගුරු විද්‍යාල සඳහා අනුමත ඇගයීම් පරිපාටිය (2010) පදනම් කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන අතර, බාහිර ඇගයීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් විශේෂ විෂය ක්ෂේත්‍රයේ එක් එක් විෂය සඳහා පවත්වනු ලැබේ. එක් එක් විෂයයේ බාහිර පරීක්ෂණයේ ලකුණුවලින් 60%ක් ද අභ්‍යන්තර පරීක්ෂණයේ ලකුණුවලින් 40%ක් ද වශයෙන් ලකුණු ඒකාබද්ධ කර අදාළ විෂයයේ ලකුණ තීරණය කරනු ලැබේ.



පාඨමාලාව සාර්ථක ව හදාරා නිම කරන ගුරු සිසුන්හට "ගුරු පුහුණු සහතික පත්‍රය" පිරිනමනු ලබන අතර එය ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - 1 (ආ) ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාලීමකි.

ගුරුවරයාට සිය වෘත්තියේ නියැළීමට අවශ්‍ය මූලික වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට අවස්ථාව සැලසීමට පමණක් මෙම පාඨමාලාව සීමා නොවන අතර, ගුරු සිසුන්ගේ නිර්මාණශීලීත්වය, සාමූහිකත්වය ප්‍රවර්ධනයට ද මෙමගින් අවස්ථාව සලසා ඇත. එමෙන් ම ගුරුවරයා අධ්‍යාපනයේ පදනම සේ සලකා, ඔවුන්ගේ විභවතා මතු කරමින්, ඔහු දැනුම බෙදා හරින්නෙකු පමණක් නොව නවෝත්පාදකයෙකු, සමාජ විපර්යාසකරුවෙකු ලෙස සංවර්ධනය කිරීම සඳහා, ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව, මෙම ජාතික කාර්යයට නායකත්වය සලසා ඇත.

# කාර්යසිද්ධි කළමනාකරණය - Event Managemant

13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන යටතේ වන වෘත්තීය විෂය විසි හයෙන් එක් විෂයයක් ලෙස කාර්යසිද්ධි කළමනාකරණ විෂයය ප්‍රථම වරට පාසල් අධ්‍යාපනයට හඳුන්වා දී ඇත. නවීන විද්‍යා හා තාක්ෂණික ප්‍රගමනයන්ට සමගාමී ව සමාජීය වශයෙන් සිදුවන වෙනස්වීම් හමුවේ කාර්යසිද්ධි කළමනාකරණය විෂයයක් වශයෙන් සංවර්ධනය විය.

ශ්‍රී ලංකාව හා ලෝක ඉතිහාසය දෙස අවධානය යොමු කිරීමේ දී දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රවලට සම්බන්ධ පැවැත් වූ කාර්යසිද්ධි පිළිබඳව තොරතුරු පුරාවෘත්ත,පුරාවිද්‍යාත්මක සාධක හා ජනප්‍රවාදවල සඳහන් වේ. ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවය, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම, දළදා පෙරහැර වැනි ජාතික මට්ටමේ කාර්යසිද්ධි හා වර්තමානයේ පවා ක්‍රියාත්මක වන ඔලිම්පික් ක්‍රීඩා උළෙල මේ සඳහා නිදසුන් ලෙස දැක්විය හැකි ය. මුල් කාලීන ව මේවා කාර්යසිද්ධි නමින් හැඳින්වූයේ නැති වුව ද වර්තමානය වන විට වෘත්තියක් ලෙස දියුණුවීමට තිබූ අවකාශය මත කාර්යසිද්ධි කළමනාකරණය කර්මාන්තයක් ලෙස විකාශනය වී ඇත.

දහනමවන සියවසේ අගභාගයේ පමණ සිට කාර්යසිද්ධි කළමනාකරණය කර්මාන්තයක් ලෙස ලෝක මට්ටමින් ආරම්භ වුවත් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූයේ විසිවන සියවසේ අගභාගයේ සිට ය. වර්තමානය වන විට කාර්යසිද්ධි කර්මාන්තය විවිධ ක්ෂේත්‍ර සමඟ ජාල ගත වී ක්‍රියාත්මක කෙරේ.

- සම්පාදන කළමනාකරණය Logistic Management
- අලෙවිකරණය Marketing
- තොරතුරු තාක්ෂණය Infomation Technology
- ගෝලීයකරණය Globalization




එමගින් කාර්යසිද්ධි කළමනාකරණ කර්මාන්තය නව ප්‍රවණතා ඔස්සේ සංවර්ධනය වෙමින් ප්‍රකාශයට පත්වන ආකාරය දැක ගත හැකි ය. ඒ අනුව බොහෝ අය වර්තමානය වන විට උපන්දින සාදයේ සිට ඔලිම්පික් උළෙල දක්වා වූ විවිධ කාර්යසිද්ධි ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීමේ අරමුණින් එබඳු අවස්ථා වෘත්තීය විශේෂඥයින් ලවා සිදු කර ගැනීමට පෙළඹී ඇත. මේ නිසා කාර්යසිද්ධි කළමනාකරණය සම්බන්ධ විවිධ සේවා සැපයීමට කුඩා හා මහා පරිමාණ ආයතන (Event Companies) මෙන් ම ජාතික හා ජාත්‍යන්තර සංවිධාන (Event Organization) ද බිහි වී ඇත.

වර්තමානය වන විට ඇමෙරිකාව, ජර්මනිය, සිංගප්පූරුව, මැලේසියාව ආදී සංවර්ධිත රටවල් කාර්යසිද්ධි කළමනාකරණය කර්මාන්තයක් ලෙස විවිධාකාරයෙන් පවත්වාගෙන යාමෙන් ආර්ථික හා සමාජීය වශයෙන් ප්‍රතිලාභ අත්පත් කර ගෙන ඇත. කාර්යසිද්ධි පැවැත්වීම හරහා සංචාරණය සඳහා ස්ථාන තෝරා ගැනීමට සංචාරකයින් පෙළඹවීමෙන් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා ප්‍රබල බලපෑමක් ඇති කිරීමට ද සමත් වී ඇත. ඒ අනුව වර්තමානය වන විට මෙම කර්මාන්තය පුළුල් හා සංකීර්ණ ලෙස විකාශනය වීමේ ප්‍රතිඵලයක් ලෙස සුවිශේෂී ක්ෂේත්‍ර ඔස්සේ වර්ධනය වී ඇත. කාර්යසිද්ධි කර්මාන්තය ලෝකයේ පිළිගත් ආයතන තුනක් ඔස්සේ සංවිධානය වී ඇත.

1. වෘත්තීය සම්මේලන සංවිධාන
   Professional Conference Organization - PCO
2. වෘත්තීය ප්‍රදර්ශන සංවිධාන
   Professional Exhibition Organization - PEO
3. කාර්ය සිද්ධි කළමනාකරණ සමාගම්
   Event Management Company

මෙම ආයතන ආශ්‍රිත ව ජාතික හා ජාත්‍යන්තර තලයේ සුවිශාල රැකියා වෙළෙඳපොළක් නිර්මාණය වී ඇත. ඒ අනුව මේ වන විට කාර්යසිද්ධි කර්මාන්තයේ වර්තමාන පැවැත්ම, අනාගතය හා වැදගත්කම පිළිබඳ ව බොහෝ විද්වතුන් තුළ පුළුල් දැක්මක් ගොඩනැගී ඇත. දැනුම පදනම් කර ගත් ආර්ථිකයක් කරා පිය මනින අනාගත පරපුර පුහුණු ව්‍යවසායකයින්, වෘත්තිකයින් ලෙස සංවර්ධනය වුවහොත් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තරය සමඟ සම්බන්ධ කිරීමේ දී බොහෝ වාසි අත්පත් කර ගත හැකි ය.






මෙම පසුබිම තුළ විශ්වවිද්‍යාලවල උපාධි මට්ටමේ විෂයයක් ලෙස ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබූ කාර්යසිද්ධි කළමනාකරණ විෂයය 13 වසරක සහතික කරන ගුණ අධ්‍යාපන වැඩසටහන යටතේ පාසල් අධ්‍යාපනයට හඳුන්වා දෙමින් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු ද ආරම්භ කර ඇත.

අ. පො. ස (සා.පෙළ) විභාගයෙන් පසු පාසල හැරයන්නන්ට තවදුරටත් වසර දහතුනක අනිවාර්ය අධ්‍යාපන අවස්ථා සලසා දීමෙන් ඔවුන් සතු කුසලතා සංවර්ධනය කොට විවිධ නිපුණතාවලින් පෝෂිත පුහුණු වෘත්තිකයන් ලෙස රැකියා වෙළෙඳපොළට ප්‍රවේශවීමට අවස්ථාව උදාකිරීම මෙම විෂයෙන් අපේක්ෂා කරයි. මෙම අරමුණ පෙරදැරිව සිසු පරපුරට අනාගතයේ යහපත් පුරවැසියන් ලෙස රටේ තිරසර සංවර්ධනයට දායක වීමට අවශ්‍ය න්‍යායාත්මක සහ ප්‍රායෝගික අත්දැකීම් පාදක කොට කාර්යසිද්ධි කළමනාකරණය විෂයමාලාව සංවර්ධනය කර ඇත.

12 වන ශ්‍රේණියේ දෙ වන සහ තුන් වන අධ්‍යයන වාර සඳහා කාලච්ඡේද 100 බැගින් වූ විෂය නිර්දේශ සහිත මොඩියුල දෙකක් සම්පාදනය කර ඇත.







13 වන ශ්‍රේණියේ දී මෙම විෂයය ප්‍රධාන විෂයය ලෙස තෝරා ගන්නා සියලු ම සිසුන් පූර්ණකාලීන ආයතනික පුහුණුව සඳහා යොමු කිරීමෙන් අනතුරුව ජාතික වෘත්තීය සුදුසුකමක් වන NVQ 4 සහතිකය පිරිනැමේ.

කාර්යසිද්ධි කළමනාකරණ විෂයය සම්බන්ධයෙන් NVQ 4 සහතිකලාභී වෘත්තීය නිපුණයන්ට මෙම විෂය යටතේ වැඩිදුර අධ්‍යාපන සඳහා ද අවස්ථා උදාකර දී ඇත.

## කාර්යසිද්ධි කළමනාකරණ විෂයයේ වැඩිදුර අධ්‍යාපන අවස්ථා

**විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ තෘතීයික හා වෘත්තීමය අධ්‍යාපන අවස්ථා**

**කාර්යසිද්ධි කළමනාකරණය**

**තෘතීයික අධ්‍යාපනය**

- උපාධි
- පශ්චාත් උපාධි

**වෘත්තීය අධ්‍යාපනය**

- ඩිප්ලෝමා NVQ - 5
- උසස් ඩිප්ලෝමා NVQ - 6
- උපාධි මට්ටම NVQ - 7





## අධ්‍යාපන ආයතන හා පාඨමාලා

| ආයතන | පාඨමාලාව |
|---|---|
| වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය රත්මලාන මාතර සහ මඩකලපුව විශ්ව විද්‍යායතනය | කාර්යසිද්ධි කළමනාකරණය උසස් ජාතික ඩිප්ලෝමාව - (NVQ-6) |
| ව්‍යාපාර කළමනාකරණය ජාතික පාසල (NSBM) හරිත විශ්වවිද්‍යාලය | කාර්යසිද්ධි සංවිධාන සහ සත්කාරක සේවා පිළිබඳ විද්‍යාවේදී (Plymouth University,UK) |
| කළමනාකරණ සහ විද්‍යා විශ්ව විද්‍යායතනය (MSU)Colomb Campas | කාර්යසිද්ධි කළමනාකරණය උපාධිය |
| ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය මාලබේ (SLIIT) | කාර්යසිද්ධි කළමනාකරණය ඩිප්ලෝමාව |




# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව

1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතෙන් පවරා ඇති බලතල අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට වෘත්තීය පුහුණුව ලබාදීමේ වගකීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී ඇති අතර, එම වෘත්තීය සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා 1989 වසරේ දී ආරම්භ කර අඛණ්ඩ ව පවත්වාගෙන යනු ලබන එක් පාඨමාලාවක් ලෙස පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හඳුන්වා දිය හැකි ය. ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින්, පවත්වා ගෙනයනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් පාඨමාලාවකි.

- පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සහ ආයතන සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධියක් තිබිය යුතු ය.

- රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය පාසලක ගුරු භවතකු (SLTS) හෝ විදුහල්පතිවරයකු (SLPS) හෝ පිරිවෙන් ආචාර්යවරයකු /කථිකාචාර්යවරයකු, පිළිගත් ආගමික අධ්‍යාපන ආයතනයක ආචාර්යවරයකු හෝ සේවාස්ථ ගුරු උපදේශක/ගුරු අධ්‍යාපනඥ සේවයේ (SLTES) හෝ අධ්‍යාපන පරිපාලන සේවයේ (SLEAS) නියුතු නිලධාරියකු එම හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පූර්ණ කාලීන ව සේවයේ නියුතු නිලධාරියකු විය යුතු ය.





අධ්‍යාපන ක්ෂේත්‍රයට පිවිසෙන නවක උපාධිධාරීන්, ගෝලීය වශයෙන් ඇතිවන්නා වූ වෙනස්වීම්වලට අනුගත වෙමින් සහ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුනා ගනිමින් අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මක සංවර්ධනය ඇති කිරීමට දායක විය යුතුය. ඒ අනුව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව එම සියලු අවශ්‍යතා සපුරාලීමට සමත් වූ නවීකරණවලට ප්‍රමුඛ ස්ථානයක් ලබා දෙමින් ක්‍රියාත්මක කෙරේ. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ ගුණාත්මක තත්ත්වය සඵල කරලනු වස්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් හඳුන්වා දී ඇති "ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට" අනුව (Sri Lanka Qualification Framework) විෂයමාලාව ප්‍රතිසංවිධානය කර ඇති අතර, මෙම පාඨමාලාව සාර්ථක ව සම්පූර්ණ කරන්නන්ට ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ අටවන මට්ටම (SLQF 8) ප්‍රදානය කෙරේ. එමෙන්ම පාඨමාලාවේ සියලු අවශ්‍යතා සපුරාලන්නන් සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (PGDE) සහතිකය ප්‍රදානය කරනු ලැබේ.

සිංහල හා දෙමළ මාධ්‍යවලින් ක්‍රියාත්මක වන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ඔබ අපේක්ෂා කරන්නේ නම් ඔබ විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

- පළමු පත්වීම් දින සිට අඛණ්ඩ ව ස්ථිර සේවයේ නියුතු වයස අවුරුදු 52 (අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට) නොඉක්මවූවන් විය යුතු ය.

පාඨමාලාවට බඳවා ගැනීම තරඟ විභාගයක් හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් පමණක් සිදු කරනු ලබන අතර එම තෝරා ගැනීමේ පරීක්ෂණය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත ය.

- **අභියෝගතා පරීක්ෂණය (පැය 01)**

- **අධ්‍යාපන ක්ෂේත්‍රයේ සාමාන්‍ය දැනුම (පැය 02)**

පාසල්වල සහ අධ්‍යාපන ආයතනවල සේවය කරන ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ වෘත්තීය සුදුසුකම් ලබා නොමැති උපාධිධාරී ගුරු භවතුන්, කථිකාචාර්යවරුන් සහ නිලධාරීන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය විභවතාවල ගුණාත්මක තත්ත්වය ඉහළ නංවමින් වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීමට අවකාශ මෙමගින් විවර කර ඇති අතර දැනට දිවයින පුරා ප්‍රාදේශීය මධ්‍යස්ථාන 28ක දී පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා අවස්ථාව සලසා ඇත. මෙම පාඨමාලාව අර්ධ කාලීන වන අතර, මතු සඳහන් ප්‍රාදේශීය මධ්‍යස්ථානවල දී සති අන්තවල සහ පාසල් නිවාඩු කාලයේ දී ක්‍රියාත්මක වේ.



2014 වසර දක්වා ම මෙම වැඩසටහන් ජාතික රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය, ස්වර්ණවාහිනිය, සහ ඩයලොග් TV ආදී නාලිකාවන් ඔස්සේ විකාශය විය. එහෙත් මේ වන විට එම විකාශ මන්දගාමී වීමත් සමග ඊට පිළියම් සෙවූ විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව, "අන්තර්ජාල නාලිකාවක භාවිතය" පිළිබඳ අවධානය යොමු කරන්නට විය. ඒ අනුව වත්මන් විද්‍යා හා තාක්ෂණික ප්‍රගමනයට සමගාමී ව, ආයතනය මගින් නිෂ්පාදනය කරනු ලබන අධ්‍යාපනික වීඩියෝ වැඩසටහන් සමස්ත ලාංකීය ශිෂ්‍ය ප්‍රජාව වෙත පහසුවෙන් සම්ප්‍රේෂණය කළ හැකි මාධ්‍යයක් ලෙස, අන්තර්ජාල නාලිකාවක් භාවිත කිරීමේ වැදගත්කම අවධාරණය කර, ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ අනුමැතිය ද සහිත ව Channel NIE නමින් අන්තර්ජාල නාලිකාවක් නිර්මාණය කරනු ලැබීය.

අධ්‍යාපන ලේකම් නිහාල් රණසිංහ මැතිතුමා විසින් 2019 සැප්තැම්බර් මස 25 වන දිනට යෙදුණු සුභ මොහොතින් ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනව බහු කාර්යය පන්මහල් ගොඩනැගිල්ල විවෘත කිරීමත් සමග, Channel NIE නාලිකාවෙහි පළමු වැඩසටහන් මාලාව දියත් කිරීම ද සිදුවිය.

1 මහරගම
2 ගම්පහ
3 කළුතර
4 ගාල්ල
5 මාතර
6 තංගල්ල
7 මහනුවර
8 මාතලේ
9 පොළොන්නරුව
10 අනුරාධපුරය
11 ඇඹිලිපිටිය
12 රත්නපුර
13 කෑගල්ල
14 බදුල්ල
15 මහියංගනය
16 මොනරාගල
17 බණ්ඩාරවෙල
18 කැකිරාව
19 අම්පාර
20 කුලියාපිටිය
21 කුරුණෑගල
22 නිකවැරටිය
23 හලාවත
24 හම්බන්තොට
25 බලංගොඩ
26 බිබිල
27 නුවරඑළිය
28 පේරාදෙණිය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවට සහභාගිවීමට හෝ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම් ජාතික සම්බන්ධීකාරක, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව, ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය , මහරගම යන ලිපිනයට ලිපි යොමු කිරීමෙන් හෝ 0117-601744 දුරකථන අංකය ඇමතීමෙන් ලබා ගත හැකි ය.




පළමු පිටුවෙන්...

## ජාතික අධ්‍යාපන ආයතනයෙන් Channel NIE නමින් අන්තර්ජාල නාලිකාවක්




විවිධ වූ විෂය පිළිබඳ අභ්‍යන්තර හා බාහිර සම්පත් දායකයන්ගේ සෘජු දායකත්වය ලබා ගනිමින්, විෂයමාලාවට අනුකූල ව විවිධ වූත්, විචිත්‍ර වූත් වැඩසටහන් මාලාවක් සිසු දරුවන්ට, ගුරුවරුන්ට මෙන් ම සමස්ත ප්‍රජාවට ම දැකබලා ගැනීමට අවස්ථාව Channel NIE මගින් උදා වී ඇත. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුළුල් නිම් වළලු සොයා යන සැමට ඥාන ගවේෂණයක නියැළීමේ මංපෙත් ද මෙතුළින් විවර කර ඇත.

ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යවලට වඩාත් උචිත විෂය හෝ විෂය ඒකක තෝරා ගනිමින් මතු සඳහන් මූලික විෂය සන්ධාර සඳහා වූ වැඩසටහන් දැනට නිෂ්පාදනය වෙමින් පවතී.

- විද්‍යා අධ්‍යාපනය සඳහා සුවිශේෂ වැඩසටහන්
- ප්‍රාථමික අධ්‍යාපනය සඳහා සුවිශේෂ වැඩසටහන්
- සෞන්දර්ය අධ්‍යාපනය සඳහා සුවිශේෂ වැඩසටහන්
- තාක්ෂණ හා වෘත්තීය විෂය සඳහා සුවිශේෂ වැඩසටහන්
- පරිසර අධ්‍යයනය සඳහා සුවිශේෂ වැඩසටහන්

මෙම සියලු වැඩසටහන් ඔබට පහසු වේලාවක නොමිලේ නැරඹීමේ අවස්ථාව Channel NIE තුළින් උදා වී ඇත.



# ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අනුස්මරණ දේශනමාලාවේ 30 වන දේශනය

**"හෙට ලෝකය සඳහා ජ්‍යෙෂ්ඨ ද්විතීයික හා විද්‍යාලයීය තලයේ විෂයමාලාවලට නව අර්ථ කථනයක්"**

ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් 1988 වසරේ දී ආරම්භ කර වාර්ෂික ව පවත්වනු ලබන ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අනුස්මරණ දේශන මාලාවේ 30 වන දේශනය 2019 ඔක්තෝබර් මස 14 වන දින ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල් ඩී. ඒ. පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබී ය.



මෙවර දේශනය "හෙට ලෝකය සඳහා ජ්‍යෙෂ්ඨ ද්විතීයික හා විද්‍යාලයීය තලයේ විෂයමාලාවලට නව අර්ථ කථනයක්" මැයෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ගණිත අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය උපාලි මාම්පිටිය මහතා විසින් පවත්වනු ලැබී ය.



මෙහි දී ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික හා විද්‍යාලයීය තලයේ (Collegiate) විෂයමාලාව, ඊට අදාළ වන ජාත්‍යන්තර මිනුම් ලකුණු හා සන්සන්දනය කරනු ලැබී ය. එමෙන් ම යථෝක්ත අධ්‍යාපන මට්ටම් දෙකට ම බලපාන ප්‍රධාන ගැටලු දෙකක් ලෙස සිසුන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍යයට දැඩි ව බලපාන්නා වූත්, ශාස්ත්‍රීය ආතතියට හේතු වන්නා වූත් අධිභාරයක් දරන විෂයමාලාව පිළිබඳ ව සහ 21 වන සියවසේ අධ්‍යාපනය ලබන්නවුන් මුහුණ දෙන අභියෝගවලට සරිලන අන්දමේ පුළුල් කුසලතා සමූහයක්, පාසල් විෂය මාලාවෙන් සිසුනට සැපයේ ද යන්න පිළිබඳ ව සාකච්ඡා කරනු ලැබී ය.

ජාතික තලයේ ආයතන මගින් අධ්‍යාපන සුදුසුකම් පිළිගැනීම සඳහා ඉදිරිපත් කොට ඇති අවශ්‍යතා සහ පාසල් හැර යන ළමුන්ගේ අවශ්‍යතා ඉටු කෙරෙන අයුරින් 21 වන සියවසේ අධ්‍යාපනය ලබන සිසුන්ට මුහුණපෑමට සිදුවන අභියෝගවලට සාර්ථක ව මුහුණ දී හැකි, වඩාත් පුළුල් වූ කුසලතා සමූහයක් මගින් පාසල් විෂයමාලාව ප්‍රශස්ත මට්ටමකට පත් කර ගැනීමට ඉවහල් වන යෝජනා සමූහයක් ද ආචාර්ය මාම්පිටිය මහතා විසින් ඉදිරිපත් කෙරිණි.

තෙවන පිටුවෙන්...





යෝජිත නිර්දේශ අනුව 10 සහ 11 ශ්‍රේණි ගණිත විෂය තුළ හඳුනා ගත් අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප මගින් දරුවා ඇගයීමට භාජනය කරන අතර එය පළමු වන ප්‍රශ්න පත්‍රයෙන් සිදු වේ. සංඛ්‍යා, මිනුම්, වීජ ගණිතය, ජ්‍යාමිතිය, කුලක හා සම්භාවිතාව සහ සංඛ්‍යානය යන තේමාවල තෝරා ගත් විෂය කරුණුවලට යම් යම් සීමා පැනවීමෙන් මෙම අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප ගොඩ නගා ඇත. මෙහි දී දරුවාට අත් වන වාසිය වන්නේ තෝරා ගත් විෂය කරුණු ඇසුරින්, දැනුම හා කුසලතා, සන්නිවේදනය හා සම්බන්ධතා දැකීම යන හැකියා පමණක් මැනෙන පරිද්දෙන් ප්‍රශ්න සැකසී තිබීම යි. එසේ ම මෙම හඳුනා ගත් විෂය කරුණු තුළ යම් යම් විෂය සීමා පනවා තිබීම ද ගැටලු විසඳීමේ දී දරුවාට පහසුවක් වනු ඇත. පළමු වන පත්‍රය මගින් දරුවාගේ ඉහළ මානසික හැකියා මැන බැලීමක් අපේක්ෂා නො කරන අතර සමස්ත ලකුණුවලින් 50%ක් මේ මගින් දරුවාට ලබා දීමට අපේක්ෂිත ය. මේ ආකාරයට සාමාන්‍ය පෙළ ගණිත ප්‍රශ්න පත්‍රය සමත් වීමේ ලකුණ 35%ක් ලෙස සැලකේ නම්, පළමු ප්‍රශ්න පත්‍රයට 70%ක් (මෙය අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්පවල මූලික සාධන මට්ටම ලෙස සැලකිය හැකි ය) ලබා ගන්නා ඕනෑම ශිෂ්‍යයෙකුට, දෙවෙනි පත්‍රයට කිසිදු ලකුණක් ලබා නොගෙන වුවත් ගණිතය සමත් ලකුණ සපුරා ගත හැකි ය. එසේ ම දෙවන ප්‍රශ්න පත්‍රයෙන් සමස්ත 10-11 ශ්‍රේණි විෂය නිර්දේශ ඇගයීමට භාජනය කරනු ලබන හෙයින් ඊට ද හොඳින් මුහුණ දීමෙන් දරුවාගේ සාධනය තවදුරටත් ඉහළ නංවා ගත හැකි ය.




## අධ්‍යාපන පර්යේෂණ සඟරාව සඳහා ලිපි භාර ගැනේ

පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂික ව පළ කෙරෙන ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව (සිංහල මාධ්‍ය හා ඉංග්‍රීසි මාධ්‍ය) සහ සාක් අධ්‍යාපන පර්යේෂණ සඟරාවට 2020 වර්ෂය සඳහා ලිපි රැස් කිරීම මේ වන විට ආරම්භ කර තිබේ. සිංහල මාධ්‍ය අධ්‍යාපන පර්යේෂණ සඟරාව සඳහා සිංහල මාධ්‍යයෙන් ද ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපන පර්යේෂණ සඟරාව සහ සාක් අධ්‍යාපන පර්යේෂණ සඟරාව සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද ලිපි සම්පාදන කිරීමේ අවස්ථාව ඔබට තිබේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂණකරණයේ නියැළෙන ඔබට තම පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීම සඳහා මහඟු අත්වැලක් මෙමඟින් සැපයෙන අතර, යථෝක්ත සඟරාවලට ලිපි ලබා දීමට ඔබ අපේක්ෂා කරන්නේ නම් ඒ සම්බන්ධ වැඩිදුර තොරතුරු ජාතික අධ්‍යාපන ආයතනයේ නිල වෙබ් අඩවියෙන් (w.w.w.nie.lk) ලබා ගත හැකි ය.

## අධ්‍යාපන පර්යේෂණ තේමා පාඨමාලා දෙකක්

අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂණ කාර්යයන්හි නියැළෙන ඔබගේ පර්යේෂණ දැනුම සංවර්ධනය කිරීමේ අරමුණින් පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ව අධ්‍යාපන පර්යේෂණ තේමා පාඨමාලා දෙකක් පවත්වනු ලැබේ. නෙදින වැඩමුළු වශයෙන් පැවැත්වෙන මෙම පාඨමාලා මඟින් පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ තේමාවක් පිළිබඳ ව වඩා ගැඹුරු වූත් න්‍යායාත්මකවූත් දැනුම් සම්භාරයක් ප්‍රායෝගික පුහුණුව සහිත ව ලබා ගැනීමට ද ඔබට අවකාශ විවර කර ඇත.

2019 වර්ෂයේ දී ද ''පර්යේෂණ යෝජනාවක් ලිවීම'' හා ''ශාස්ත්‍රීය ලේඛන ශෛලිය'' මැයෙන් වූ තේමා පාඨමාලා දෙකක් සාර්ථක ව නිම කරන ලද අතර පර්යේෂණකරණයේ නියැළෙන විද්‍යාර්ථීන් හැට දෙනෙකු පමණ මෙම පාඨමාලා දෙක ඇසුරින් දැනුවත් බව හා පුහුණුව ලැබීය.

පාඨමාලාවලට අවශ්‍ය සම්පත් දායකත්වය පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යයන කාර්ය මණ්ඩලය ප්‍රමුඛ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවීණ බාහිර විද්වත් මණ්ඩලයක් ඇසුරින් සැපයේ.

2020 වර්ෂය සඳහා ද අධ්‍යාපන පර්යේෂණ තේමා පාඨමාලා දෙකක් පවත්වනු ලබන අතර මෙවර තේමා පාඨමාලා වෙන්වනුයේ "දත්ත විශ්ලේෂණය" තේමාව වෙනුවෙනි. පළමු වන තේමා පාඨමාලාව 2020 මැයි මාසයේ දී පැවැත්වීමට අපේක්ෂිත ය. පාඨමාලාව සඳහා බඳවා ගැනෙන පාඨමාලාලාභීන් සංඛ්‍යාව ඉතා සීමිත වන අතර, 2020 වර්ෂයේ ජනවාරි මාසයේ දී මේ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලා සඳහා සහභාගිවීමට ඔබ අපේක්ෂා කරන්නේ නම් ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු ආයතනයේ නිල වෙබ් අඩවියෙන් ලබාගත හැකි ය.


## සන්දර්ශන NEWSLETTER දායකත්වය

**උපදේශකත්වය**
ආචාර්ය ජයන්ති ගුණසේකර - අධ්‍යක්ෂ ජනරාල්

**අධීක්ෂණය**
ආචාර්ය දයානන්ද කෑන්ගෙපිටගොඩ - අධ්‍යක්ෂ

**ප්‍රධාන සංස්කාරක**
ජේ. ජී. එන්. පුලෙව්කා ඇලෙක්සැන්ඩර් - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**සංස්කාරක මණ්ඩලය**
1. ඩබ්. ජේ. ශිරානි පුෂ්පමාලා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
2. එන්. ජී. දිසානායක - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
3. ඩී. හෙට්ටිගේ - කථිකාචාර්ය
4. එම්. ඩී. ඩී. අභිරුණි ද සිල්වා - සහකාර අධ්‍යාපනඥ

**බාහිර සම්පත් දායකත්වය**
ජේ. ජේ. අනේෂා සාලුකී - මාධ්‍ය සම්බන්ධීකාරක
එෂරි නිරංජලා ගමගේ - මාධ්‍ය සම්බන්ධීකාරක

**ලිපි සැපයූවෝ**
විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව
විද්‍යා දෙපාර්තමේන්තුව
ගණිත දෙපාර්තමේන්තුව
ආගම් හා සාරධර්ම දෙපාර්තමේන්තුව
ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව
පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව

**භාෂා සංස්කරණය**
ආචාර්ය ගොඩ්වින් කොඩිතුවක්කු

**පරිගණක පිටුව නිර්මාණකරණය**
ටී. ඩබ්ලිව්. ඩී. සංජීව